**මාර්ග සංවර්ධන අධිකාරිය - 2018**

---------------------------------------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මාර්ග සංවර්ධන අධිකාරියේ "අධිකාරිය" 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ පරිපාලිත සමාගම් සමඟ වන අන්තර් සමාගම් ශේෂ සන්සන්දනය කර නොතිබීම. | සමාගම් අතර සිදු වූ ඇතැම් ගනුදෙනුවල ලිඛිත තොරතුරු සොයාගැනීම ගැටළුවක් වී තිබේ. | අධිකාරියට අයත් පරිපාලිත සමාගම් අතර ගනුදෙනු සටහන් කිරීමේ පිළිගත් එකඟතාවයන් හා කාලීනව සැසඳීම් සිදු කිරීම් කළයුතුය. |

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගිණුම්කරන ඒකක සංකල්පයට හා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිත අංක 01 ප්‍රකාර මහනැගුම මහමැදුර ගොඩනැගිල්ලෙන් වර්ග අඩි 72,400 ක ප්‍රමාණයක් මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් භාවිතා කරන බැවින් ඊට අදාල පිරිවැය රු. මිලියන 496.57 ක් හා වාර්ෂික ක්ෂය රු.මිලියන 24.83 ක් සඳහා ගැලපීම කර නොතිබුණි. | මේ සඳහා ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාර මහ නැගුම මහා මැදුර ගොඩනැගිල්ලෙන් රේඛීය අමාත්‍යාංශය භාවිතා කරන බිම් ප්‍රමාණය පදනම් කරගෙන එහි ප්‍රාග්ධනිත අගයත් ක්ෂය වටිනාකමත් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම කළ යුතුය. |
| (ආ) මහනැගුම මහ මැදුර ගොඩනැගිල්ලේ පිහිටි වර්ග අඩි 3,580 ක දේශන ශාලාව භාවිතයට සුදානම් තත්ත්වයේ නොතිබුණ බැවින් රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 01 ට අනුව වත්කම් ලෙස හඳුනාගත නොහැකිය. නමුත් එය වත්කමක් ලෙස හඳුනා ගෙන 2018 දෙසැම්බර් 31 දින වන විට ක්ෂය රු. මිලියන 25.7 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | මෙම ශාලාව සම්මන්ත්‍රණ ශාලාවක් ලෙස පරිවර්ථනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර දැනට තාවකාලික ගබඩාවක් ලෙස භාවිතා කරනු ලබයි. | අදාළ ගොඩනැගිලි කොටස් අපේක්ෂිත කාර්යයට යොදා ගැනීමට ඉක්මනින් කටයුතු කර, ක්ෂය කිරීම් සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කිරීම. |
| (ඇ) තෙලගපාත පොලිසිය වෙනුවෙන් රු.මිලියන 80.8 ක වියදමින් ඉදිකරන ලද ගොඩනැගිල්ල වාර්ෂිකව රු.මිලියන 4.04 ක් බැගින් ක්ෂය කරනු ලැබුව ද එහි සෘජු ප්‍රතිලාභ මාර්ග සංවර්ධන අධිකාරියට නොලැබෙන නිසා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාර මෙම ගොඩනැගිලි අධිකාරියේ වත්කම් වලින් හා ඊට අදාළ ක්ෂය මූල්‍ය ප්‍රකාශන වලින් බැහැර කර නොතිබුණි. | තෙලගපාත ගොඩනැගිල්ල අධිවේගී මාර්ගයන්හි මෙහෙයුම් කටයුතු වල පොලිස් මුරපොල සංකීර්ණය ලෙස ස්ථාපිත කර ඇත. එසේ වුවද අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කොට මෙම ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව දන්වමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 පරිදි කටයුතු කළ යුතුය. . |
| (ඈ) අධිකාරියේ වත්කම් ලේඛනයේ ගොඩනැගිලි වටිනාකමට ඇතුලත්ව තිබූ රු. මිලියන 3.23 ක් වූ ඉඩම් සඳහා වාර්ෂිකව රු. 161,500 බැගින් ක්ෂය වෙන් කිරීම් සිදු කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට එහි සමුච්චිත ක්ෂය රු. මිලියන 2.43 ක්ව තිබුණි. | මෙම ඡේදයේ සඳහන් කරුණු හා එකඟ නොවේ. ඉඩම් ක්ෂය කර නොමැත. අතපසුවීමකින් ඉඩම් ලෙස උපලේඛනයේ සඳහන් කර ඇති තොරතුරු නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. | ඉඩම් උපලේඛනයේ සඳහන් කර ඇති තොරතුරු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) මාර්ග සංවර්ධන අධිකාරියේ වත්කම් ලේඛනයට අනුව 2018 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. මිලියන 177 ක් වූ ගොඩනැගිලි සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන්ව තිබූ බැවින් ඒවා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 03 හෝ 07 අනුව ප්‍රත්‍යාගණනය කර හෝ නැවත ඇස්තමේන්තු කර ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කිරීමට කළමනාකරණය පියවර ගෙන නොතිබුණි. | මෙම ගොඩනැගිලි වල වටිනාකමද තක්සේරු කොට ඉදිරියේ දී ගිනුම් ගත කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හෝ 07 අනුව කටයුතු කිරීම. |
| (ඊ) පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතියේ අදියර II මගින් රු.මිලියන 71.15 ක පිරිවැය වූ නිවාස සහ කාර්යාල ගොඩනැගිලි මාර්ග සංවර්ධන අධිකාරිය වෙත 2018 වර්ෂය තුළ පවරා දී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළ දී මෙම වත්කම් ගිණුම්වලට ගෙන නොතිබුණි. | 2019 ජුනි 12 දිනැති අංක RDA/FD/FAS/12 දරන අධ්‍යක්ෂ මුදල්ගේ ලිපිය මගින් විස්තරාත්මක තොරතුරු මෙම ව්‍යාපෘතියෙන් කැඳවා ඇති අතර ඒ පිළබඳ තොරතුරු ලැබුණ පසු ගිණුම් වලට ගැලපීමට කටයුතු කරනු ඇත. | අදාළ ගොඩනැගිලි කඩිනමින් ගිණුම් වලට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) 2018 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන 5,129.5 ක් වූ යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණවල ධාරණ අගය රු.මිලියන 68.2කි. මෙම වත්කම් වලින් සැලකිය යුතු ප්‍රතිශතයක් ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය අවසන්ව තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 සහ 07 අනුව එකී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කිරිම සම්බන්ධයෙන් සුදුසු ක්‍රමවේදයක් සකස් කර ඉදිරි වර්ෂවලදී කොටස් වශයෙන් ප්‍රත්‍යාගණන කටයුතු ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද බව දන්වමි. | අදාළ වත්කම් කඩිනමින් ප්‍රත්‍යාගණනය කර දැක්වීමට හෝ නැවත ප්‍රකාශ කිරීමට පියවර ගත යුතුය. |
| (ඌ) අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ප්‍රදානවල හා ලී බඩු හා උපකරණ වල ක්ෂය වෙන්කිරීම් හා ක්ෂය සම්බන්ධ මූල්‍ය ප්‍රකාශන හා ස්ථාවර වත්කම් ලේඛනය අනුය රු. මිලියන 53.7 ක වෙනසක් පැවතුණි. | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මාර්ග සංවර්ධන අධිකාරිය සහ ප්‍රදාන වල ක්ෂය හා ක්ෂය වෙන් කිරීම්වල ශේෂයන් මූල්‍ය ප්‍රකාශන අනුව නිවැරදි විය යුතු බව දන්වන අතර එම වෙනස්වීම් අදාල ක්ෂය ගැලපීම් 2019 වසරේදී සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාළ නිවැරදි කිරීම් සිදුකර වාර්තා කළ යුතු වීම. |
| (එ) පිරිවැය රු. මිලියන 1,787 ක් වූ වාහන 417 ක් 2018 ජනවාරි 01 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. මෙම වත්කමේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර දැක්වීමට කටයුතු කර නොතිබුණි. | යාන්ත්‍රික අංශයේ පිළිගත් අදාල වෘත්තීය සුදුසුකම් වරලත් යාන්ත්‍රික ඉංජිනේරු කමිටුවක් මගින් දැනටමත් තක්සේරු කර ඇති අතර 2019 ජුලි මස වන විට මාසික ගිණුම් වාර්තා වලට ගැලපුම් සටහන් සිදු කරනු ලබන බව දන්වමි. | අදාළ වාහන සම්බන්ධ ගැලපුම් රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති වලට අනුව සිදු කිරීම. |

**1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අඩමාණ ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේ දී හෙළිදරව් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | මෙම ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන A , B හා AB ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර් 12,180 ක් පැවතිය ද ඒවායේ දිග, ප්‍රමාණය හෝ වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 7,508 ක පිරිවැය වූ මාර්ග 03 ක් ප්‍රාග්ධනීත කිරීමට පියවර ගෙන තිබුණි. | මාර්ග වල වටිනාකම ගණනය කිරීමට සුදුසු ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන එම ප්‍රතිපත්ති මූල්‍ය වාර්තාවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ ප්‍රතිපත්තිය හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) විදේශීය ආධාර වර්ගීකරණය යටතේ වූ වාහන සඳහා වාර්ෂික ක්ෂය ලෙස රු. මිලියන 7.03 ක් දක්වා තිබූ අතර, ගණනය කිරීම අනුව එය රු.මිලියන 16.07 ක් විය යුතු බැවින් වාර්ෂික ක්ෂය තුළ රු.මිලියන 9.04 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වාහනය විශේෂ කාර්යයන් සඳහා භාවිතා කරන වාහනයක් වන බැවින් මෙහි ඇස්තමේන්තු ගත ඵලදායි ජීවිත කාලය වසර 10 කි. එබැවින් සියයට 10 ක ක්ෂය කිරීමක් සිදු කර ඇත. ඉදිරියේදී මේ සම්බන්ධ ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය වාර්තා වල හෙළිදරව් කරනු ලැබේ. | මූල්‍ය වාර්තාවල අදාළ ගිණුම් ප්‍රතිපත්ති අනාවරණය කළ යුතුය. |

**1.5.4 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව වසර 05 ට වැඩි රු. මිලියන 283 ක ණයගැති ශේෂ පැවතියද බොල්ණය සඳහා වෙන්කිරීම් කර තිබුණේ රු. 168,831 ක් පමණි. | මෙයින් රු. මිලියන 281 ක් 2015 ට පෙර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලට අදාළ වන නිසා ඒ සඳහා පත්කළ කමිටු වාර්තාව 2018 ලද නිසා බොල්ණය සඳහා වෙන්කිරීමක් නොකරන ලදී. | අයනොවීමේ කාල ප්‍රමාදය සලකා නිවැරදිව වෙන් කිරීම් සිදු කිරීම. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව, කඩුවෙල - කඩවත දක්වා වූ මාර්ග කොටසේ පිරිවැය රු.මිලියන 47,819 ක් වූ අතර, එකී ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව එහි පිරිවැය රු.මිලියන 47,824.9 ක් වූයෙන් රු.මිලියන 5.9 ක වෙනසක් පැවතුණි. | වෙනසට අදාළ ගැලපුම් 2019 වර්ෂයේ දී ජ'ර්නල් සටහන් මඟින් සිදුකරන ලදී. | මේ සම්බන්ධ අභ්‍යන්තර පාලනය විධිමත් කළ යුතු අතර අවශ්‍ය සැසදීම් සිදුකල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිරිවැය රු. මිලියන 113,709.7 ක් වූ අතර, එදිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. මිලියන 116,347.2 ක් වූයෙන් රු. මිලියන 2,637.5 ක වෙනසක් පැවතුණි. | වෙනසට අදාළ ගැලපුම් 2019 වර්ෂයේ දී ජ'ර්නල් සටහන් මඟින් සිදුකරන ලදී. | මේ සම්බන්ධයෙන් අභ්‍යනතර පාලනය විධිමත් කළ යුතු අතර අවශ්‍ය සැසඳීම් සිදුකල යුතු වීම. |
| (ඇ) අධිකාරිය වෙත ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතියෙන් භාරදෙන ලද ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිලි වටිනාකම හා අන්තර්ගත කරන ලද රු. මිලියන 208.78 ක් වටිනා ලී බඩු හා වත්කම් මිලදී ගැනීම් තවදුරටත් ගොඩනැගිලි පිරිවැය තුළම පැවතීම. | මෙයින් රු. මිලියන 175.8 ක් 2019 වර්ෂයේදී ගිණුම්ගත කර තිබූ අතර ඉතිරි කොටස ඉදිරි වසර තුලදී ගැලපුම් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | නියමිත පරිදි ගිණුම්ගත කිරීම් සිදු කිරීම කළ යුතු වීම. |
| (ඉ) බොරලැල්ල හා මධ්‍යම පළාතේ අධිකාරිය සතු කඩ කාමර 37 ක වටිනාකම තක්සේරු කොට මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | ඉදිරියේ දී ගිනුම් ගත කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | වටිනාකම තක්සේරු කොට ගිණුම්ගත කළයුතු අතර, ඒ අනුව සාධාරණ කුලියක් අය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ මිලදී ගෙන තිබුණු රු.මිලියන 9.1 ක් වටිනා රසායනාගාර උපකරණ 112 ක් ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු පේරාදේණිය සරසවියේ ඉංජිනේරු පීඨයේ පීඨාධිපති වෙත පරිත්‍යාග කර තිබූ නමුත් පොත් වලින් ඉවත් නොකිරීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට වූ ස්ථාවර වත්කම් ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රවර්ථන වසර තුලදී පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | මේ පිළිබඳව අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම. |
| (උ) අවතැන් වූවන් පදිංචි කිරීමේ පරමාර්ථයෙන් මිලදී ගත් රු. මිලයන 123 ක් වටිනා අත්තිඩිය ඉඩමෙන් අක්කර 02 රූඩ් 03 පර්චස් 38 ක් “නිපුනතා පියසට” ලබා දී තිබුණද, ඒ සඳහා මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් සිදුකර නොතිබුණි. | නව කැළණි පාලම ඉදි කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේදි රාජ්‍ය ආයතනයක් වන “නිපුණතා පියසට” අයත් අක්කරයක පමණ බිම් කොටසක් අත්පත් කරගෙන ඇති අතර, එම ඉඩම වෙනුවට මෙම ඉඩම ලබා දී ඇත. | අදාළ ගැලපීම මූල්‍ය ප්‍රකාශන වල සිදු කිරීමට කටයුතු කිරීම. |
| (ඌ) 2018 වර්ෂයේ දී වැඩ අවසන් කළ පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතියේ වත්කම් රු . මිලියන 795 ක්, 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කර ඇති අතර, එසේ පැවරූ වත්කම් අතර රු. මිලියන 8.2 ක් වූ ඉඩම් ඇතුළත් වුවද එම ඉඩම්වල වටිනාකම අධිකාරියේ ගිණුම්වලට ගෙන නොතිබුණි. | වටිනාකම් තක්සේරු කර අධිකාරියේ ගිණුම් වලට ඇතුලත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වමි. | ව්‍යාපෘති වලින් අධිකාරියට වත්කම් පැවරීමේ අභ්‍යන්තර පාලනය විධිමත් කිරීමට හා නිසි පරිදි ගිණුම් තැබීම සිදු කිරීම. |

| | | |
|---|---|---|
| (එ) දකුණු ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (STDP) හා එහි දිගුව වූ පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය (OCH) විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත හිමිකම් ඔප්පු මඟින් පවරා දී තිබූ ඉඩම් කැබලි 10 ක් සහ නිදහස් දීමනා පත්‍ර මඟින් ලද ඉඩම් කැබලි 02 ක් අධිකාරිය සතු වූවද ඒවා අධිකාරියේ පොත් වලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් දෙක ප්‍රවර්තන වර්ෂයේ ජූලි මස ජර්නල් සටහන් අංක 237/J07 මගින් ගිණුම් ගත කල බව දන්වමි. | වත්කම් ගිණුම්ගත කිරීම් අප්‍රමාදව සිදු කිරීමටත් ඒ පිළිබඳ අභ්‍යන්තර පාලනය විධිමත් කිරීමටත් ක්‍රියා කළ යුතුය. |
| (ඒ) ඉඩම් හුවමාරුවක් මඟින් අධිකාරිය වෙත ලද ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩමේ ප්‍රතිශ්ඨාව පියවීම සඳහා ගෙවූ රු. මිලියන 50 ක මුදල එකවරම අධිකාරියේ වියදමක් ලෙස හඳුනාගෙන තිබූ බව නිරීක්ෂණය වූ අතර එය ප්‍රාග්ධනිත කර බදු ගිවිසුම් කාලය පදනම් කර ගෙන සමානව ක්‍රමක්ෂය කර නොතිබුණි. | මෙය මෙහෙයුම් බදු ගිවිසුමක් වන නිසාත් එය අය කර ගත නොහැකි පිරිවැයක් නිසාත් වත්කමක් ලෙස සැලකිය නොහැක. | කල් බදු කාලය තුළ අධිකාරිය මෙම වටිනාකම ක්‍රමක් ක්ෂය කළ යුතුය. |
| (ඔ) 2018 මූල්‍ය වර්ෂයට අදාලව 2019 වසරේ මුල් මාස 03 ක් තුළදී අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ගෙවීම් අංශය විසින් දරණ ලද වියදම් සම්බන්ධව සිදුකරන ලද සීමිත නියැදි විගණන පරීක්ෂාවේදී 2018 වර්ෂය සඳහා අදාළ වන්නාවූ රු.මිලියන 26.05 ක වියදමක් එම වර්ෂය සඳහා ගිණුම් ගත නොකිරීම නිසා වියදම ඌන ගණනය වී තිබූ අතර ලාභය අධි ගණනය වී තිබුණි. | ඉදිරියේදී ගිණුම් ගත නොවූ උපචිත වියදම් වර්ගයන් අදාල අංශයන්ගෙන් නොපමාව ගෙන්වා ගෙන ඒ වෙනුවෙන්ද ප්‍රමාණවත් වෙන් කිරීම් සිදු කරන බව දන්වන අතර ඒ පිළිබඳව ඉතා දැඩි අවධානයක් යොමු කරන මෙන් අදාල නිළධාරීන්ට උපදෙස් දෙනු ලැබූ බව දන්වමි. | වර්ෂයට අදාළ වියදම් හා ආදායම් එම වර්ෂයේ දීම හඳුනාගැනීමට අදාළ අභ්‍යන්තර ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. |
| (ඕ) 2018 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරියේ භාවිතය සඳහා එක් කර තිබූ රු.මිලියන 57.65 ක පිරිවැය වටිනාකමකින් යුත් වාහන 11 ක් වත්කම්වලට ඇතුළත් කර නොතිබුණි. මීට අදාල රු. මිලියන 7.72 ක ක්ෂය වටිනාකමක්ද ගිණුම්ගත වී නොතිබුණි. | ගිණුම් ගත නොවූ වාහන 04 ට අදාළ ක්ෂය වටිනාකම වූ රු.මිලියන 2.08 ක් පෙර වර්ෂයේ ලාභයට ගැලපීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | ව්‍යාපෘති වලින් වත්කම් අත්පත් කර ගැනීමේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමටත්, ඒ අනුව ගිණුම්කරණ සිදු කිරීමත් කළ යුතුය. |
| (ක) 2017 වර්ෂයේ එකතු කිරීම් තුළ ඇතුළත්ව තිබූ රු.මිලියන 9.5 ක් වටිනා මොටර් රථය 2018 වර්ෂයේ වත්කම් ලේඛනය තුළ ඇතුළත් වී නොමැත. | අතපසුවීමකින් වත්කම් ලේඛනයෙන් මෙම වාහනය ඉවත් වී ඇති අතර ඒ පිළිබඳව පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | අදාළ නිවැරදි කිරීම් සිදුකළ යුතුය. |
| (ඛ) 2018 වසරේ එකතු කිරීම් ලෙස දක්වා තිබූ පිරිවැය රු. මිලියන 114.80 ක් වූ වාහන 12 ක් ස්ථාවර වත්කම් ලේඛන අනුව 2017 මැයි 16 දින ලද බවට සඳහන් කර තිබූ බැවින් එදින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා සම්පූර්ණ ක්ෂය ප්‍රමාණයම 2018 වර්ෂයට ගලපා තිබුණි. | ක්ෂය ප්‍රමානය ප්‍රමානාත්මක නොවන නිසා 2017 ට නොගලපා 2018 වර්ෂයට ගලපන ලදී. | ප්‍රමානාත්මක තාවය පිළිබඳ කළමනාකරණය විසින් තීරණය කොට අදාළ ගිණුම්තැබීම් සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ග) | අධිවේගී මාර්ග ඉදි කිරීම සඳහා වැය කළ රු. මිලියන 245,769 ක මුදල ජනරජ ගිණුමේ ණය මුදලක් ලෙස හෙළිදරව් කර තිබිය දී අධිකාරියේ ගිණුම්වල රාජ්‍ය ප්‍රදාන ලෙස ගිණුම්කරණය කිරීමට අදාළ පදනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අධිකාරියට මේ සම්බන්ධ ගෙවීම් බැඳියාවක් නොමැති අතර අධිවේගී මාර්ග වත්කම් ලෙස සැලකීම නිසා. | ප්‍රදාන ලෙස සැලකීමට අදාළ මූලාශ්‍ර ලේඛන භාණ්ඩාගාරයෙන් ලබා ගත යුතු වීම. |
| (ඝ) | අධිකාරියේ අභ්‍යන්තර විගණනය විසින් නිරීක්ෂණය කරන ලද තොරතුරු වලට අනුව ව්‍යාපෘතීන් කීපයක් විසින් ඉදිකර අධිකාරිය වෙත බාර දී ඇති කාර්යාල ගොඩනැගිලි, සංචාරක නිවාස සහ නිල නිවාස විශාල ප්‍රමාණයක් අධිකාරියේ වත්කම් ලේඛනයට හෝ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. | දැනටමත් අදාළ ව්‍යාපෘති වලින් තොරතුරු කැඳවා ඇති අතර එම තොරතුරු ලද පසු ඉදිරියේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | නියමිත ගිණුම්පටිපාටිය අනුගමනය කර ගිණුම්කරණය කළ යුතුය. |
| (ඞ) | කොළඹ මාතර අධිවේගී මාර්ගයේ පිහිටි හෙක්ටයාර් 0.8218 ක් වූ ඉඩමක් හා හෙක්ටයාර් 6.4085 ක් වූ ඉඩමක් ප්‍රාග්ධනිත කිරීමට සමාලෝචිත වර්ෂයේ දී ද අධිකාරිය කටයුතු කර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියට ඔප්පුවකින් නීතිමය අයිතිය පැවරෙන තුරු ඉඩම් ගිණුම්ගත නොකිරීම මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම් කරන ප්‍රතිපත්තිය වේ. මේ සම්බන්ධ අදාළ තොරතුරු ලබාගෙන ගිණුම් ගත කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | මෙවැනි ඉඩම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කිරීම. |
| (ච) | විගණනය වෙත ලබා දී ඇති උපලේඛනය අනුව කිසිදු වටිනාකමක් සඳහන් නොවූ වාහන 661 ක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ලබා දී තිබූ උපලේඛන සමඟ පරීක්ෂා කිරීමේ දී කිසිදු පිරිවැයක් සඳහන් නොවන වාහන 661 ක් පැවතුන අතර මෙම වාහන නැවත අගය කර ගිණුම් තැබීමට කටයුතු කරමි. | අදාළ වාහන තක්සේරු කොට සාධාරණ අගය පොත්වලට ගැනීම සිදු කිරීම. |

**1.5.5 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. මිලියන | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. මිලියන | වෙනස රු. මිලියන | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වෙන මගනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සමාගම සමඟ වූ ජංගම ගිණුමෙහි ඇතුළත් සිසිල් පෙරමුසු (Cold mix supply) ශේෂයෙහි රු. මිලියන 10.4 ක වෙනසක් පැවතුණි. | 73.1 | 62.7 | 10.4 | විස්තර සොයා ගැනීමේ අපහසුතාවය නිසා මෙම වෙනසට හේතු සොයා ගැනීම ප්‍රමාද වී ඇත. තවදුරටත් සැසඳීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. | මේ සම්බන්ධව අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු අතර සැසඳුම් ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කළ යුතුය. |
| (ආ) | මග නැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සමාගමේ අවසන් ගිණුමේ ඇතුලත් ව්‍යාපෘති 07 කට අදාළ සහතික කළ වැඩ එකතුව රු. මිලියන 23.8 ක් මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වෙන මගනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සමාගම සමඟ වූ ජංගම ගිණුමෙහි ඇතුලත් කර නොතිබුණි. | - | 23.8 | 23.8 | බිල්පත් අස්ථානගත වීම්, විචලතා නියෝග අනුමත වීම ප්‍රමාද වීම යනාදී හේතු මත රු. මිලියන 22.7 ක බිල්පත් ගිණුම්ගත වී නොමැත. තවද, රු. මිලියන 1.1 ක බිල්පත් අධිකාරියට අදාළ නොවන නිසා මගනැගුම උපදේශන සමාගම වෙත ආපසු යවා ඇත. | අන්තර් සමාගම් ගනුදෙනු සටහන් කිරීමට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය විධිමත් කිරීම. |
| (ඇ) | මග නැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සමාගමේ 2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ව්‍යාපෘති 02 කට අදාළ රු. මිලියන 5.31 ක් වූ මුදල අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ මගනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සමාගම සමඟ වූ ජංගම ගිණුමෙහි ඇතුළත් කර නොතිබුණි. | - | 5.31 | 5.31 | ඉදිරි ගැලපුම් සිදු කිරීමට බලාපොරොත්තු වේ. | අන්තර් සමාගම් ගනුදෙනු සටහන් කිරීමට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය විධිමත් කිරීමට කටයුතු කිරීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වෙන මගනැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම නමින් වූ ජංගම ගිණුමෙහි දැක්වෙන පරිදි අධිකාරිය විසින් සමාගමට රු. මිලියන 2,612 ක් ගෙවිය යුතු ලෙස දැක් වූවද, එම සමාගමේ මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන අධිකාරිය නමින් වූ ජංගම ගිණුම අතර නොසැසදෙන ලද ශුද්ධ වෙනස රු. මිලියන 880 ක් විය. | 2612 | 1732 | 880 | තවදුරටත් සැසඳීම් කටයුතු කරමින් පවතින අතර ප්‍රමාදයට හේතුව තොරතුරු සපයා ගැනීමේ අපහසුවයි. | මේ සම්බන්ධව අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු අතර සැසඳුම් ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කළ යුතුය. |

## 1.5.6 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 වගන්තිය සහ 2011 නොවැම්බර් 18 දිනැති අංක 1732/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 07 ඡේදය ප්‍රකාරව අධිවේගී මාර්ගවලින් එකතු කරන ගාස්තු අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, එම මුදල් ජාතික මහාමාර්ග සංවර්ධනය කර පවත්වා ගෙන යාමේ කාර්ය සඳහාම භාවිතා කරනු ලැබිය යුතු නමුත්, 2018 දෙසැම්බර් 31 දක්වා අධිවේගී මාර්ග පද්ධතියෙන් එකතු කර ගෙන තිබුණු රු.මිලියන 36,074 ක ආදායමෙන්, රු.මිලියන 24,379 ක් උක්ත ගැසට් පත්‍රයේ නියමයන්ට පරිබාහිර වියදම් සඳහා යොදා ගෙන තිබුණි. තවද, උක්ත වියදම තුළ 2015 සිට 2018 වර්ෂය දක්වා වූ කාලච්ඡේදය තුළ ශ්‍රී ලංකා පොලිසිය වෙනුවෙන් දරන ලද රු.මිලියන 264 ක වියදම් ද ඇතුලත්ව තිබුණි. | නිසි පරිදි භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබුණු හේතුවෙන් අනෙකුත් කටයුතු සඳහා ඉහත මුදල් භාවිතා කර තිබුණ ද 2015 න් පසු එය දැඩි පාලනයක් සහිතව එම කටයුතු සඳහා ම භාවිතයට ගනු ලැබූ අතර මහා භාණ්ඩාගාරයේ අවසරය ඇතිව වැටුප් ගෙවීමේදී ඇතිවන අරමුදල් ඌනතාවය සඳහා භාවිතා කරන ලදී. අධිවේගී මාර්ගයේ පොලිස් කොට්ඨාශයේ රාජකාරී කටයුතු සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කොට ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට කටයුතු කරනු ලැබේ. | මෙම මුදල් ඉඩදී ඇති කාර්යයන්ට වියදම් කිරීම හෝ අධිකාරියේ කටයුතු සඳහා ලබා ගන්නේ නම්, ඒ සඳහා විධිමත් අධිකාරිය ලබා ගැනීමට කටයුතු කිරීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අගෝස්තු 15 දින පැවති කැබිනට් මණ්ඩල තීරණ මත අධිවේගී මාර්ග වලින් ලැබූ ආදායමෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබා ගෙන තිබූ රු.බිලියන 04 ක මුදල තවදුරටත් අයවී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා දැනුවත් කර එම රු.බිලියන 4 ක මුදල පියවාගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීම් කර ඇත. | අදාළ මුදල් අයකර ගැනීම සඳහා පසුවිපරම් සිදු කිරීම. |
| (ආ) | ව්‍යාපෘති කළමනාකරණ ඒකක වෙත අධිකාරිය විසින් සපයන ලද විශේෂ ණය / අත්තිකාරම් වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් අධිකාරිය වෙත ප්‍රතිපාදන නොලැබීම නිසා තවදුරටත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලැබිය යුතු ණය මුදල රු. මිලියන 5,667 ක් විය. | වසර ආරම්භයේ පැවති රු.මිලියන 5,667 ක් වූ ශේෂය 2019 මැයි 31 දිනට රු.මිලියන 4,467 දක්වා අඩුකරගෙන ඇත. | අදාළ මුදල් අයකර ගැනීමට හෝ රේඛීය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය සහ අධිකාරිය එක්ව මේ සඳහා ප්‍රතිපත්තිමය එකඟතාවයකට පැමිණීමට කටයුතු කිරීම. |
| (ඇ) | 2011 වර්ෂයේ අයවැය යෝජනා යටතේ පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම 2012 / 13 වර්ෂ වලදී සිදුකර තිබුණි. ඒ අනුව දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කය තුළ සිදුකරන ලද ව්‍යාපෘති වෙනුවෙන් අධිකාරිය වෙත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු තවත් රාජ්‍ය ආයතනය 04 කින් අයවිමට තිබූ මුදල රු. මිලියන 1,060 ක් විය. | අදහස් දක්වා නොමැත. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. තවද, ඉදිරියේදී මෙවැනි අයවීම් සම්බන්ධයෙන් නිරන්තර පසු විපරම් කළ යුතු වීම. |
| (ඈ) | අධිකාරිය ලබා දී ඇති ආපදා ණය වලින් රු. මිලියන 1.83 ක ශේෂයක් තවදුරටත් අය නොවී පැවතුණි. | අය නොවන ශේෂයන්ගෙන් රු. 229,975 ක ශේෂය අයකර ගනිමින් පවතී. රු. 99,600 ක මුදලක් අයකරගෙන අවසන් වී ඇත. | ආයතන සංග්‍රහය අනුව ක්‍රියාකර අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | විවිධ අංශ විසින් ක්‍රියාත්මක කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කොන්ත්‍රාත් 20 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබාදී තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දිනට අය විය යුතුව පැවති ශේෂය රු. මිලයන 36.23 ක් විය. | ඇතැම් සුරක්ෂණ මුදල් බවට පත්කර ගැනීමට කටයුතු කරමින් පවතන අතර, ඇතැම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් බිල්පත් ඉදිරිපත් කර නැත. තවද, ඇතම් සුරක්ෂණවල කාලය දිර්ඝ කර ගෙන ඇත. | සුරක්ෂණ මුදල් කිරීම මගින් හෝ බිල්පත් මගින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඊ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට යොමු කර ඇති කොන්ත්‍රාත් සංඛ්‍යාව 07 ක් වූ අතර, ඒවායින් අයවීමට ඇති වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය රු. මිලියන 17.51 ක් විය. | එම ශේෂ සම්බන්ධයෙන් නීතිමය කටයුතු කරමින් පවතී. | නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කර අදාළ අයකර ගැනීම සිදු කළ යුතු වීම. |
| (උ) කොන්ත්‍රාත් 79 ක වැඩ අවසන් කිරීමේ ඉලක්කගත දිනයන් 2018 දෙසැම්බර් 31 දිනට ඉක්මවා ගොස් තිබූ අතර ඒවාගෙන් අයවීමට තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල රු. මිලියන 394.8 කි. මෙයින් රු. මිලියන 17.04 කට අදාළ අත්තිකාරම් සුරක්ෂණ කාලය දීර්ඝ කරගෙන තිබුණි. තවත් ව්‍යාපෘති 15 න් රු. මිලියන 38.17 ක් අය කරගෙන තිබූ නමුත් ව්‍යාපෘති 58 කට අදාළ රු. මිලියන 338.79 ක් අයවිය යුතුව පැවතුනි. | කොන්ත්‍රාත් පිළිබඳව කරුණු සොයා බලා ලබාදුන් අත්තිකාරම් නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වමි. | අදාළ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර අයවිය යුතු අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කිරීම. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

**-----------------------**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ සහ පළාත් කාර්යාල 04 කින් සිදු කළ සේවාදායක වැඩවලට අදාළව වසර 03 සිට 04 දක්වා රු.මිලියන 85 ක් ද, වසර 04 සිට 05 දක්වා රු.මිලියන 57 ක්ද සහ වසර 05 ට වැඩි රු. මිලියන 130 ක් වූ ද සේවාදායක තැන්පතු පැවති අතර අදාළ කාර්යය නිම වූ පසු මේ සම්බන්ධයෙන් නිසි පසු විපරම් කිරීමක් සිදු නොකර තවදුරටත් දීර්ඝ කාලයක් තැන්පතු ලෙසම රඳවා තිබුණි. | සේවාදායක තැන්පතු සම්බන්ධව සෑම වසරකම පසු විපරමක් සිදු කරන අතර 2018 වසරේදීද එකී තැන්පතු සම්බන්ධව ගැඹුරු පරීක්ෂාවක් සිදුකර දීර්ඝ කාලයක් නොවෙනස්ව පැවති තැන්පතු පිළිබඳව නිසි සොයා බැලීමක් සිදු කරන ලදී.<br>තවද, වැඩ නිම වූ සේවාදායක වැඩ වෙනුවෙන් ලද තැන්පතු රු. මිලියන 92.61 ක් ආදායමට එරෙහිව ලියා හැරීමට සමාලෝචිත වර්ෂය තුලදී කටයුතු කළ බව දන්වමි. | සේවාදායක තැන්පතු කාලීනව සමාලෝචනය කර එම ශේෂ අධිකාරියේ අදායමට ගැනීමට කටයුතු කිරීම මගින් අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය සවිමත් කිරීම. |
| (ආ) අධිකාරියේ සේවාදායක වැඩ වෙනුවෙන් ලබාගෙන ඇති රු. මිලියන 366 ක් වූ ආපසු ගෙවිය යුතු සහ තැන්පතු වසර 03 කටත් වඩා වැඩිකාලයක් නිරවුල් නොකර පැවතුණි. | විගණන විමසුමේ ඇමුණුම අංක 03 හි දැක්වෙන සංඛ්‍යා අතුරින් රු. මිලියන 366 ක් අයත් වනුයේ සේවාදායක වැඩ වෙනුවෙන් ලබා ගත් ආපසු ගෙවිය හැකි තැන්පතු වේ. මේ සම්බන්ධයෙන් තොරතුරු කැඳවීම් කර දිගුකාලීන තැන්පතු ආදායමට බැර කිරීමට හෝ නැවත ගෙවීමට නිසි පියවරයන් ගන්නා බව දන්වමි. | කළමනාකරණයේ එකඟතාවය අනුව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) අධිකාරියේ ජංගම හා ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇති රු.මිලියන 1,877 ක් වූ රඳවාගත් මුදල් පිළිවෙලින් වර්ෂ 03 සිට 04, වර්ෂ 04 සිට 05 සහ වර්ෂ 05 ඉක්ම වූ ඒවා වූ අතර ඒවායේ වටිනාකම පිළිවෙලින් රු.405, 224, 406 ක් විය. කෙසේවුවද, මේ සඳහා කොන්ත්‍රාත්කරු ඉල්ලීම් නොකිරීම, කිසිඳු හේතුවක් දක්වා නොමැතිව තවදුරටත් රඳවා ගෙන තිබූ මුදල රු.මිලියන 629 ක් විය. | අදහස් දක්වා නොමැත. | අදාළ රඳවාගත් මුදල් ශේෂ සමාලෝචනය කර නිරවුල් නොවී පවතින හේතු අනුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 26 වන වගන්තිය | වෙනත් පාර්ශවයක් සමග ගිවිසුම්ගත වීමට පෙර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් අමාත්‍යවරයාගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අනුකූලතාවයක් දැක්වීමට සටහන් කර ගතිමි. | පනතේ 26 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීම. |
| (ආ) 2018 ජූනි 28 දිනැති අංක 2018/CL/35 දරන මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පරිපාලන චක්‍රලේඛය | ජනප්‍රිය සේවා ස්ථානයක වසර 05 ක් හෝ ඊට වැඩි කාලයක් සම්පූර්ණ කර තිබීම සහ මීට පෙර ජනප්‍රිය නොවන සේවා ස්ථානයක වසර 03 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර නොතිබීම නිසා සේවකයන් ස්ථාන මාරු සඳහා ඉල්ලුම් නොකලද සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු කිරීම් කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රමානුකූලව කළමණාකාරිත්වය විසින් සකස් කරමින් පවතී. | ස්ථාන මාරුවීි ප්‍රතිපත්තියක් ඉක්මනින් සකසා ඒ අනුව කටයුතු කිරීම. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයෙහි 04වන වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය නොවන මාස දහයක වැටුප් ණය රු .මිලියන 1.83ක ණය ශේෂ 31 ක් අයකර නොමැත. | ඇපකරුගෙන් අයකරමින් පවතින අතර එය අසාර්ථක වුවහොත් නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ 04 වැනි වගන්තිය ප්‍රකාර කටයුතු කිරීම. |

(ඇ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | | |
|---|---|---|---|
| (i)මු.රෙ . 395 | බැංකු සැසඳුම් සැලකිය යුතු කාල ප්‍රමාදයකින් යුක්තව විගණනය වෙත ඉදිරිපත් කර තිබීම. | නියමිත දිනට බැංකු සැසඳුම් පිළියෙල කලද බැංකුවේ නිල මුද්‍රාව සහිත බැංකු ප්‍රකාශය නියමිත දිනට අදාළ පළාත්භාර කාර්යාල වලට නොලැබීම හේතුවෙන් බැංකු සැසඳුම් නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. | සෑම මසකටම අදාළ බැංකු සැසඳුම් ඊළඟ මස 15 හෝ ඊට ප්‍රථම රජයේ විගණනයට ඉදිරිපත් කිරීමට ක්‍රියාකළ යුතුය. |
| (ii)මුදල් රෙගුලාසි සංග්‍රහය 880 හා 881 | රජයේ මුදල් භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් මුදල් ඇප තැන්පතුවක් ලෙස ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ ක්‍රමවේදය ඉකමනින් ක්‍රියාවට නැංවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරනරාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තිය | සුබසාධන කටයුතු සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත් කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සැපයීම සඳහා එකී අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂාකර බලා ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | යථෝක්ත චක්‍රලේඛනයට අනුව සුභසාධන කටයුතු පවත්වා ගෙන යාම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරාජ්‍ය ආයතන සංග්‍රහයේ VI වන පරිච්ඡේදයේ 04 වන වගන්තිය | සෑම නිලධාරියෙකු වෙනුවෙන්ම පෞද්ගලික ලිපි ගොනුවක් අංග සම්පූර්ණව පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම සිදු කළ යුතු වුවත් අධිකාරිය එකී නියමයන්ට අනුව පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි. | මෙම ලිපිගොනු දැනටමත් සකස් කරමින් පවතින අතර ආයතනයේ සේවක සංඛ්‍යාව වැඩි බැවින් මේ සඳහා කාලයක් ගත වනු ලැබේ. | පෞද්ගලික ලිපිගොනු පවත්වා ගෙන යාම විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) 2009 අප්‍රේල් 16දිනැති අංක 2009/09 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2017 අයවැය යෝජනා අංක 373 | චක්‍රලේඛය ප්‍රකාරව බස්නාහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලය ඇතුලු තවත් ප්‍රාදේශීය කාර්යාලවල සේවක පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | මෙම ඇඟිලි සලකුණු යන්ත්‍රය ඉදිරියේදී මිලදී ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ චක්‍රලේඛය පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකිරීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

සමාලෝචිත වර්ෂයේ බදු පසු මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 2,213 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. මිලියන 779 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 1,434 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පෙර වර්ෂයට සාපේක්ෂව පුද්ගල දීමනා හා ආදායම් බදු වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

---------------------------

| | 2018 | 2019 |
|---|---|---|
| ජංගම අනුපාතය | 2: 1.54 | 2: 1.14 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1: 1.52 | 1: 1.13 |

පෙර වර්ෂයේ ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය සමඟ සැසඳීමේදී ධනාත්මක වර්ධනයක් නිරූපනය වන අතර ක්ෂණික වත්කම් අනුපාතය ද අපේක්ෂිත අවම මට්ටමට ළඟා වී තිබූ අතර එයද පෙර වර්ෂ සමඟ වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

කෙසේ වුවද, මෙම අනුපාතයන් ධනාත්මකව ඉහළ යාමට කොළඹ නුවර අධිවේගී මාර්ග II ව්‍යාපෘතිය සඳහා මහජන බැංකුවෙන් ලබාගෙන තිබූ රු. මිලියන 12,000 ක් ණය මුදල ජංගම නොවන වගකීම් ලෙස ප්‍රතිවර්ගීකරණය කිරීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 අනාර්ථික ගනුදෙනු

--------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මග නැගුම මහ මැදුර ගොඩනැගිල්ලෙහි නඩත්තු හා උපයෝගිතාවයන් වෙනුවෙන් දරන ලද මුළු වියදමෙන් රු.මිලියන 24.19 ක් අමාත්‍යාංශය වෙනුවෙන් දරා තිබූ වියදම් විය. | මේ සම්බන්ධයෙන් අදහස් දක්වා නොමැත. | සෘජු ප්‍රතිලාභ අධිකාරියට ලැබෙන මුදල් ගෙවීම් වියදම් ලෙස හඳුනාගත යුතු අතර එසේ නොවන ගෙවීම් ප්‍රතිපූර්ණය කරගැනීමටත් කටයුතු කිරීම. |

## 3.2 හඳුනාගත් පාඩු

-----------------

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයට අදාළ අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශයේ සේවකයන් සඳහා රු. මිලියන 3.77 ක් ගෙවා පාවහන් යුගල 1300 ක් මිලදී ගැනීමේ ගනුදෙනුව සමාලෝචිත වර්ෂයේ සිදු වී තිබුණි. සැපයුම්කරු සපයන ලද සපත්තු යුගල 734 ක් සැපයුම් පිරිවිතර වලට පටහැනි වී තිබුණ ද ඒවා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප නොකිරීම නිසා අධිකාරියට පාඩුවක් සිදු වී තිබීම. | ඉදිරි ප්‍රසම්පාදනයන් වලදී මෙවැනි ප්‍රසම්පාදන දුර්වලතාවයන් සිදුනොවන පරිදී කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් දුන්බව හා ප්‍රමිතියෙන් අඩු පාවහන් නැවත සැපයුම්කරු වෙත යවා පිළිසකර කරගැනීමට කටයුතු කරන බව. | පිරිවිතරයන්ට පටහැනි සැපයුම් ප්‍රතික්ෂේප කළ යුතු අතර පිරිවිතරවලට නොගැළපේ නම් මුදල් නොගෙවා සිටීමට කටයුතු කිරීම. |
| (ආ) | අධිකාරියට අයත් අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශයේ සේවයේ නියුතු නිලධාරිණියක් නිසි අනුමැතියකින් තොරව අධිකාරියට අයත් වාහනයක් පෞද්ගලික කටයුතු සඳහා යොදාගෙන සාමාන්‍ය රාජකාරී දිනවලින් බැහැරව නිවාඩු දින වැටුප් ලබාගැනීම හා ඉන්ධන වෙනුවෙන් ගෙවීම නිසා රු. 116,166 ක පාඩුවක් සිදුකර තිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | අදාල නිලධාරිනියට එරෙහිව විධිමත් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | අධිකාරිය සඳහා ඉදිකරන ලද වර්ග අඩි 252,055 කින් සමන්විත ගොඩනැගිල්ලේ වර්ග අඩි 72,400 ක් රේඛීය අමාත්‍යාංශය විසින් භුක්ති විඳිම නිසා අධිකාරිය සතු ඇතැම් අංශ තවමත් සෙත්සිරිපාය ගොඩනැගිලේ වර්ග අඩි 16,250 ක් ස්ථාපිත කර තිබීම නිසා ඒ සඳහා රු. මිලියන 33.5 ක කුලී වියදමක් අධිකාරියට දැරීමට සිදු වී තිබුණි. | මේ සම්බන්ධව අදහස් දක්වා නොමැත. | මෙම මුදල් රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ ප්‍රධාන ආපනශාලාව බදු දීම සඳහා සහ අධිකාරිය භාහිර පාර්ශව සමඟ එළඹී වෙනත් ගිවිසුම්වලදී ගිවිසුම් ගතවන දින සඳහන් නොකිරීම, නෛතික පුද්ගලභාවය පිළිබඳ නොසළකා කටයුතු කිරීම, ගිවිසුම් පිළියෙල කිරීමේදී අධිකාරියේ නීති අංශයේ සහය ලබා නොගැනීම, මාසික කුලී බදු කුලී ගෙවීම පැහැරිමේදී ගනුලබන ක්‍රියාමාර්ග සඳහන් නොවීම අධිකාරිය වෙනුවෙන් ගිවිසුම්මය බැදීමකට එළඹිය නොහැකි පාර්ශවයන් අධිකාරිය වෙනුවෙන් ගිවිසුම් ගත වීම සිදු වී තිබුණි. | පෙන්වා දෙන ලද අඩුපාඩු ඉදිරියේ දී නිවැරදි කරගනු ලබන බව. | අධිකාරියට උපරිම වාසියක් අත්වන පරිදි ගිවිසුම් වලට එළඹීම හා එහිදී අවශ්‍ය වෘත්තිමය සහාය ලබා ගැනීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 880 ප්‍රකාර මාර්ග සංවර්ධන අධිකාරියේ අධිවේගී මාර්ග නඩත්තු කළමනාකරණ ඒකකයේ සේවයේ නියතු සෑම මුදල් අයකැමිවරයෙක්ම ඇප තැබීම සිදු කළ යුතු වුවද එසේ ඇප තැන්පතු තබා නොතිබුණි. | කළමනාකරණ අදහස් දක්වා නොමැත. | මු.රෙ. 880 පරිදි ක්‍රියා කල යුතුය. |
| (ඇ) | අධිකාරියේ සේවක සේවිකාවන්ගේ මාසික වැටුපෙන් අවකරණය වී ඇති මුදලින් සැදුම්ලත් ස්වයං ජීවන රක්ෂණ අරමුදල මගින් සිදු කරන ලද ආයෝජන වූ රු. මිලියන 197.3 ක් අධිකාරියේ ආයෝජනයක් ලෙස පැවතියද ඊට සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අධිකාරියේ සේවකයන්ගේ ස්වයං ජීවිත රක්ෂණ අරමුදල නිතිමය පුද්ගලයෙක් ලෙස සලකනු නොලබනු අතර මාර්ග සංවර්ධන අධිකාරිය නමින් එම මුදල් ආයෝජනය කර ඇත. එසේ වවුද ඉදිරියේදී ඒ වෙනුවෙන් සුදුසු ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වෙනම ඒකකයන් ලෙස සලකා කටයුතු කිරීමට අවශ්‍ය ව්‍යුහය සකස් කළ යුතු වීම. |
| (ඇ) | බොරැල්ල උමං මාර්ගයේ කඩකාමර අංක 01 හා 02 එහි බදුකරුවන් විසින් මාසික බදුකුලී ගෙවීම පැහැර හැර ඇති අතර, එම මුදල් අයකර ගැනීමට හා එම කඩකාමර වල නිරවුල් හිස් සන්තකය අධිකාරියට ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. | හිඟ මුදල් පියවන ලෙස දක්වා ඇති අතර කඩ කාමර වලින් අදාළ පුද්ගලයින් ඉවත් කිරීමට අවශ්‍යාව නිවේදන යැවීමටත්, නඩු පැවරීමටත් කටයුතු සුදනම් කර ඇත. | අදාළ නෛතික ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු අතර ඉදිරියේ දී මෙවැනි තත්ත්වයන් යලි ඇති නොවීමට වග බලා ගැනීම. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය සතු මාර්ග රක්ෂිත හා ඉඩම් බදු දීම සම්බන්ධයෙන්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලය, රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය සහිතව බදු දෙන ලද ඉඩම් හා දේපළ වලට අදාළව විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද, 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 06 වන වගන්තියේ විධිවිධාන වලට අනුව කටයුතු කර නොතිබුණි. එමෙන්ම බදු කුලී මුදල තීරණය කිරීමේ දී රජයේ තක්සේරු මගින් තක්සේරුවක් ලබාගෙන නොතිබුණි. | කරුණු සම්බන්ධයෙන් එකඟවේ. ඉදිරියේදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. | විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතු අතර 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ විධිවිධාන අනුගමනය කොට අධිකාරිය සතු මාර්ග රක්ෂිත සම්බන්ධව කටයුතු කිරීම. |
| (ආ) අධිකාරියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින රු. මිලියන 2,771ක සේවා දායක තැම්පතු පැවති අතර, කිසියම් රාජ්‍ය හෝ පෞද්ගලික පාර්ශවයකින් ලද එවැනි කාර්යයන් සම්බන්ධව ඉල්ලීම ලද අවස්ථාවේ සිට එම කාර්ය අවසන් කරන අවස්ථාව දක්වා විධිමත් ක්‍රියාවලියක් පිළියෙල කර නොතිබුණි. | විගණන විමසුමේ අංක 1.1.1 , 1.1.2 සහ 1.1.4 ලෙස සඳහන් කර ඇති කරුණු කෙරෙහි අධිකාරියේ ඉහළ කළමණාකාරීත්වය විසින් පියවර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී නොහැකි වුවද ඒ පිළිබඳ ඉදිරියේදී විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලබන බව දන්වමි. | මේ සඳහා වන විධිමත් අභ්‍යන්තර පාලන වැඩ පිළිවෙලක් සහිතව එම ක්‍රියාවලිය සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 වගන්තිය ප්‍රකාර හදිසි ප්‍රසම්පාදන ක්‍රමය භාවිතා කළ හැකි වනුයේ, මිනිසා විසින් සිදුකරනු ලබන හෝ ස්වභාවික ව්‍යසන වැනි විශේෂ අවස්ථානුගත කරුණු වලදී හෝ ප්‍රසම්පාදනය අවශ්‍ය වන හදිසි අවස්ථාවක් වශයෙන්, ශ්‍රී ලංකා රජය විසින් නිර්ණය කර ප්‍රකාශයට පත් කරනු ලබන අවස්ථාවලදී පමණක් වුවද අධිකාරිය විසින් පළාත් පහක් සඳහා රු. මිලියන 187.96 ක් වටිනා මාර්ග සළකුණු කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, කඩිනම් ප්‍රසම්පාදන කටයුත්තක් ලෙස සළකා මිලට ගෙන තිබුණි.. | පදික මාරු සුදු පැහැ කිරීමේ ජාතික ප්‍රතිපත්තිය යටතේ සුදු පාට තර්මොප්ලාස්ටික් තීන්තවල අවශ්‍යතාවය දැඩිව මතුවිය. ඒ අනුව 2018 ජූලි 06 පුවත්පත් දැන්වීම මගින් දිවයිනේ සියලුම පළාත් සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ ලංසු කැඳවන ලදී. පළාත් පහේ ද්‍රව්‍ය අවශ්‍යතාව සපයා ගැනීම සඳහා තනි කොන්ත්‍රාත්තුවක් ලෙස ප්‍රදානය කිරීමේ දී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව යටතේ ගැනෙන අතර, ප්‍රසම්පාදන කමිටු තීරණ සඳහා වැඩි කාලයක් ගත වේ. | මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 වගන්තිය අනුව හදිසි ප්‍රසම්පාදනයක් තීරණය කළ යුතු අතර හැකි සෑම විටම සමාන්‍ය ප්‍රසම්පාදන යටතේ කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අධිකාරියේ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම සඳහා කාර්ය මණ්ඩලයක් සහිතව ප්‍රසම්පාදන අංශයක් ස්ථාපිත කර තිබුණද, අධිකාරියේ ඉදිරිකිරීම්, නඩත්තු කළමනාකරණ, යන්ත්‍රික, අධිවේගී මාර්ග මෙහෙයුම් කළමනාකරණ හා නඩත්තු ඒකකය තුලදී වෙන වෙනම ප්‍රසම්පාදන කටයුතු සිදු කරයි. මේ නිසා අධිකාරියේ ප්‍රසම්පාදන කටයුතු වල ඒකාකාරීබවක් නොතිබුණ අතර ප්‍රසම්පාදන තුළින් උපරිම ආර්ථික වාසිද ලැබී නොතිබුණි. | නඩත්තු කළමනාකරණ අංශයට අයත් සියලු ප්‍රසම්පාදන කටයුතු ඒ දක්වා සිදුවූයේ මෙම අංශය මගිනි. සභාපතිතුමාගේ හා අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂකගේ උපදෙස් පරිදි ඉදිරියේ දී භාණ්ඩ සැපයුම් සඳහා ප්‍රසම්පාදන කටයුතු කරනු ලබන්නේ ප්‍රසම්පාදන අංශය විසින් බව දන්වමි. | ප්‍රසම්පාදනයේ උපරිම ආර්ථික වාසිය ලබාගැනීම සඳහා ප්‍රසම්පාදනයන් හැකි උපරිමයෙන් කේන්ද්‍ර ගතව සිදු කළ යුතුව තිබීම. |
| (ඇ) රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.313 (i) ප්‍රකාරව ලංසු සඳහා වු ඇප ලබා ගැනීමේදී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1 දක්වා වු එකවර ගෙවන නිශ්චිත මුදලක් සඳහා වන සහතිකයක ආකාරයෙන් ඇපයක් ලබා ගැනීම සිදු කළ යුතු බව දක්වා ඇත. | අදහස් දක්වා නැත. | මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 ට අනුකූලව ඇප සුරකුම් ලබාගත යුතුය. |
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 ප්‍රකාරව සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වූ වගකීම් ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව සතු වේ. නමුත් පුවත් පත් දැන්වීම් පලකිරීමෙන් පසු තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීම තුලින් පිරිවිතර සමාලෝචනය කිරීම ප්‍රසම්පාදන ලියවිලි හා අනුමත කිරීමේ කාර්යභාරය ඉටු කිරීම සිදු නොවන බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | ප්‍රසම්පාදන කටයුතු වලදී මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 ඡේදයේ දක්වා ඇති පරිදි තාක්ෂණික ඇගයීම් කමිටුවල සහය ලබාගත යුතුය. |
| (ඉ) ප්‍රසම්පාදන අත්පොතෙහි වගන්ති අංක 5.4.8 ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීම සඳහා නියමිත කාල සීමාවේ දීර්ඝ කිරීමක් සිදුවන්නේ නම්, කාර්යසාධන සුරක්ෂණයද දීර්ඝ කර දෙන ලෙස ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් කොන්ත්‍රාත්කරු වෙතින් ඉල්ලා සිටිය යුතුය. නමුත් එසේ සුරක්ෂණය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොමැති අවස්ථා පැවතුණි. | අදහස් දක්වා නැත. | අදාළ මාර්ගෝපදේශ 5.4.8 ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණවල කාලය දීර්ඝ කරගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 ප්‍රකාරව එක් එක් ප්‍රසම්පාදන කටයුතු ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් පියවර ක්‍රමානුකූලව විස්තර කරමින් ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කළයුතු වුවත්, එවැනි ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශසංග්‍රහයේ 4.2.2 පරිදි ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙල කිරීම. |
| (උ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14.1 හි අධිකාරි සීමාවන් දක්වා ඇති අතර එහි ප්‍රාදේශීය කමිටුවකට සිදු කළ හැකි ප්‍රසම්පාදනයන් හි උපරිම සීමාව රජයේ ප්‍රාග්ධන ආයකත්වය සඳහා රු.මිලියන 10 කි. නමුත් අධිවේගී මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශයේ ප්‍රසම්පාදන අංශය විසින් මෙම සීමාව ඉක්මවා ප්‍රසම්පාදන 10 ක් සිදු කර තිබුණි. | අදහස් දක්වා නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

-----------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අඩුපාඩු නිවැරදි නොකිරීම නිසා කොන්ත්‍රාත් වලට අදාළ රු.5,224,779 ක් වූ රඳවාගත් මුදල්, රඳවා තබා ගෙන තිබූ අතර ඒවා වසර 06 කට අධික කාලයක් පැවතිය ද ඊට අදාල අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ අදහස් දක්වා නොමැත. | පැවති කොන්ත්‍රාත්තුවල නිවැරදි කිරීම වහාම සිදු නොකරන කොන්ත්‍රාත්කරුවන් අසාදු ලේඛන ගත කිරීමට හා ඉදිරි ප්‍රසම්පාදන වලදී ඔවුන්ගේ ලංසු සලකා නොබැලීමක් කටයුතු කළ යුතු වීම. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) අධිකාරිය නව බඳවාගැමේ පටිපාටියක් පිළියෙලකර අනුමත කර ගෙන නොතිබුණි. | අනුමත කර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අධිකාරියේ සියලුම තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරවා ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) අධිකාරියේ ප්‍රධානම අංශය වන පරිපාලන අංශයේ අධ්‍යක්ෂ තනතුරු 2017 ජූලි 20 දින සිට පුරප්පාඩුව පැවතුණි. | බඳවා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | අධිකාරියේ පරිපාලන අංශයේ පුරප්පාඩුව නිත්‍ය නිලධාරියෙකුගෙන් කඩිනමින් සම්පූර්ණ කළ යුතු වීම. |
| (ඇ) අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තුළ වන 597ක් වූ ඉංජිනේරුවන් අතුරින් 174 ක් ම විවිධ ව්‍යාපෘති සඳහා මුදාහැර තිබුණි. මේ නිසා මාර්ග නඩත්තු කටයුතු ආශ්‍රිතව විධායක ඉංජිනේරු කාර්යල හා ප්‍රධාන ඉංජිනේරු කාර්යාල වල සැලකිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතුණි. | ව්‍යාපෘති අවශ්‍යතාවයක් සඳහා මුදාහැර තිබේ. | අධිකාරියේ නඩත්තු කටයුතු පුළුල් කිරීම් වැඩි දියුණු කිරීම් සඳහා බාධාවක් නොවන පරිදි කළමනාකරණය කරගත හැකිනම් පමණක් මුදාහල යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 මැයි 303දිනැති අංකPED/12/2003 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර අධිකාරියේ සෑම අංශයක්ම ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද අධිකාරිය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට පාලන, මූල්‍ය, සැලසුම්, පර්යේෂණ සංවර්ධන, ඉඩම් සහ යාන්ත්‍රික අංශ ඇතුලත් කර නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධව සංකලිත වූ සැලැස්මක් සකස් කිරීමට කටයුතු කෙරේ. | සෑම අංශයක්ම ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |

### 4.2 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ගිණුම් කටයුතු අයවැයකරණය, නඩත්තු, මහජන පැමිණිලි, පිරිස් පාලන කටයුතු, යනාදී ශ්‍රිතිය කාර්යයන්හි ඇති අවශ්‍යතාවය ඒකාබද්ධ වූ තොරතුරු පද්ධතියක් පිළියෙල කර නොතිබුණි. | තොරතුරු පද්ධතියක් ඉදිරියේදී හඳුන්වාදීමට අදහස්කරන බව. | ආයතනයේ අංශ හා ශ්‍රිතියන් එකිනෙක සම්බන්ධ කරන ප්‍රාදේශීය කාර්යාල අතර සංනිවේදන පහසු වන ඒකාබද්ධ තොරතුරු පද්ධිතයක් අධිකාරිය සතු විය යුතු වීම. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යභාරය සඳහා සහයෝගීව කටයුතු කළයුතු පාර්ශවයන් වන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධාන, නාගරික සංවර්ධන අධිකාරිය, තිරසාර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය සහ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය යන පාර්ශවයන් සමග පවතින සම්බන්ධය ප්‍රමාණාත්මක මට්ටමක නොතිබුණි. | තවදුරටත් රේඛීය අමාත්‍යාංශයේ සෘජු මැදිමත්වීම මත මේ පිළිබඳ දැනුවත් කිරීමට සටහන් කරගන්නා ලදී. | අදාළ ආයතනයන් සමඟ සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (ආ) කිසියම් කාර්යයක නිවැරදි කාර්ය සාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත් අධිකාරිය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළගාවීම මැන බිහිකර ගැනීමට බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් .නොතිබුණි කටයුතු කර. | තවදුරටත් රේඛීය අමාත්‍යාංශයේ සෘජු මැදිමත්වීම මත මේ පිළිබඳ දැනුවත් කිරීමට සටහන් කරගන්නා ලදී. | අධිකාරියේ සියළු ශ්‍රිතිය අංශයන් සම්බන්ධයෙන් කාර්යසාධන මිණුම් හඳුනාගත යුතු වන අතර ඒවා මැනීම හා ඇගයීමේදී ඊට අවශ්‍ය දත්ත පදනමක් බිහිකර ගත යුතුය. |
| (ඇ) තිරසාර ඉලක්ක කරා ළගා වීම සඳහා අධිකාරිය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි. | දැනට හඳුනාගෙන ඇති කාර්යයන් ඉදිරි වාර්ෂික සැලැස්මට ඇතුළත් කිරීමට හා ප්‍රතිපාදනයන් ඉදිරි වාර්ෂික අයවැයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරගෙන යනු ලබන බව දන්වමි. | තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුලත් කළ යුතු අතර ප්‍රතිපාදන වාර්ෂික අයවැයට ඇතුලත් කළ යුතුය. |